## විද්‍යුත් තාක්ෂණයෙන් ගාස්තු අයකිරීම "ETC" යනු කුමක්ද?

අධිවේගී මාර්ගය භාවිතයට ගැනීමේදී දැනට පවතින ක්‍රමය නම් ගාස්තු ගෙවීමේ කුටිය වෙත ගාස්තු තමන් විසින්ම ගෙවීමයි. එහෙත් දැන් මෙම ගාස්තු ගෙවීම **"ETC"** නම් වූ විද්‍යුත් ගාස්තු එකතු කිරීමේ පද්ධතිය මගින් ද සිදුකල හැක.

## "ETC" ඔබට උපකාරී වන්නේ කෙසේද ?

ඔබගේ ගාස්තු ගෙවීම සඳහා ඇති පිරිවැය සඵලදායී හා පහසුම ක්‍රමය විද්‍යුත් ගාස්තු එකතු කිරීමේ ක්‍රමය **"ETC"** වේ.

## "ETC"වෙත දායක වීමෙන් ලැබිය හැකි මහඟු ප්‍රතිඵල සමහරක්

- ගාස්තු ගෙවීම සඳහා ඔබ ගෙවීම් කුටිය වෙත පැමිණීම අවශ්‍ය නොවේ.
- ඔබ වෙනුවෙන්ම වෙන් වූ **"ETC"** මංතීරුවක් ඇත.
- වාහනය නැවැත්වීමට අවශ්‍ය නොවීම නිසා ඉන්ධන පාවිච්චිය අඩු වීම.
- ඔබ ස්වයංක්‍රීයව **"ETC"** ගිණුම පිරවීම තෝරාගන්නේ නම් ඔබගේ ගිණුමේ ගාස්තු හිඟවීම් කිසිදා ඇති නොවේ.
- මුදලින් ගණුදෙනු කිරීමේ අපහසුව මඟහැරේ.

## ව්‍යාපාර සඳහා ඇති වන අනෙකුත් වාසිදායක හේතූන්

- කළමනාකරණය කිරීමේ පහසුව
- ගාස්තු ගෙවීම සඳහා රියදුරන් වෙත මුදල් දීම අනවශ්‍ය වීම
- වාහන කිහිපයක් සඳහා එක සමාගම් ගිණුමකින් ගෙවීමට ඇති හැකියාව
- සමාගමේ සෑම වාහනයක් සඳහාම ගාස්තු ගෙවීම් පිළිබඳ ගිණුම් ප්‍රකාශ ලබා ගැනීමේ හැකියාව.
- රියදුරන් විසින් ගාස්තු මුදල් අයථා ලෙස යොදා ගැනීම වැලැක්වීම.

## ඔබ "ETC" යොදාගන්නා විට සිදුවන්නේ කුමක්ද ?

ඔබගේ වාහනයේ ඉදිරිපස වීදුරුව ඇතුළු පැත්තේ **"ETC"** උපාංගය සවිකරනු ඇත. ඔබ ගාස්තු එකතු කරන ස්ථානය පසුකරන විටම අයකරන නියමිත ගාස්තුව හා ඔබේ ඉතිරි වී ඇති ශේෂය ද ගාස්තු කුටිය අසල ඇති සංඥා පුවරුවේ සටහන් වේ.

## "ETC" ගිණුමක් ආරම්භ කිරීමේ උපමානයන්

**"ETC"** ගිණුමක් ආරම්භ කිරීම සඳහා අයදුම් කිරීමට ඔබට පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතුයි.

- වාහනය මාර්ග ධාවනයට සුදුසු විය යුතු අතර අධිවේගී මාර්ගවල ධාවනය සඳහා අවසර ලබා තිබිය යුතුයි.
- වාහනය ලියාපදිංචි කිරීමේ මුල් පොත

වාහන රාශියක් හිමි ව්‍යාපාරික පාරිභෝගිකයන්ට තම වාහන සමහරක් හෝ සියල්ලම සඳහා "**ETC**" ගිණුමේ ලියාපදිංචි කළ හැක. ව්‍යාපාරික අයදුම්පතක් සලකා බැලීම සඳහා, වාහන ලියපදිංචි කරනු ලබන අය පහත දැක්වෙන ලියකියවිලි ද ඉදිරිපත් කළ යුතු වේ.

- සමාගම වෙනුවෙන් නම් කරන ලද පුද්ගලයාට "**ETC**" සේවාව සඳහා වාහන ලියාපදිංචි කිරීමට, බලය ලත් අධ්‍යක්ෂවරයෙකු විසින් නිකුත් කරන ලද ලිපිය.
- ලංකා බැංකුව සමඟ "**ETC**" ගිණුමක් විවෘත කිරීම සඳහා සමාගම් අධ්‍යක්ෂවරයෙකු විසින් අත්සන් කරන ලද බලය පැවරීමේ ලිපිය.
- සමාගමේ ලියාපදිංචි අංකය

  "**ETC**" සඳහා වාහනය ලියාපදිංචි කරන පුද්ගලයා විසින් අදාළ වාහනය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වෙත රැගෙන ආ යුතු අතර තම ජාතික හැඳුණුම්පත හා සම්පූර්ණ කරන ලද "**ETC**" පාරිභෝගික සේවා අයදුම් පතද ඉදිරිපත් කල යුතුය.

## මම වාහනයක හිමිකරු නොවේ නම් ?

**"ETC"** සඳහා ලියාපදිංචි වීමට ඔබ වාහන හිමිකරුවෙකු වීම අත්‍යවශ්‍යම නොවේ. ඔබ විසින් පදවන ඔබේ බිරිඳගේ / සැමියාගේ වාහනය උදාහරණයක් වශයෙන් ගත හැක. ජාතික හැඳුනුම්පත ඇතුළු අනෙකුත් සියලු අවශ්‍ය විස්තර **"ETC"** සඳහා අයදුම් කරන විට ඔබ විසින් ඉදිරිපත් කළ යුතුය.

## "ETC" ගිණුමේ මුදල් සැමවිටම පුරවා තබාගන්නේ කෙසේද ?

මෙය ඔබට ස්වයංක්‍රීයව හෝ ඔබ විසින්ම සිදු කල හැක.

**ස්වයංක්‍රීය ක්‍රමය** - මෙමගින් ඔබගේ **"ETC"** ගිණුම පූර්ණව තබා ගැනීමේ අවශ්‍යතාවය ඔබට අමතක කල හැක. මේ සඳහා ඕනෑම ලංකා බැංකුවක ඔබේ සෘජු හර ගිණුමක් විවෘත කොට **"ETC"** අයදුම්පතෙහි ඇති සෘජු හර කොටස සම්පූර්ණ කොට භාරදීමෙන් එය ස්වයංක්‍රීයව සිදුකල හැක.

**ඔබ විසින්ම ගෙවීම** - ඕනෑම ලංකා බැංකු ශාඛාවකට පැමිණ ඔබගේ **"ETC"** ගිණුම් අංකය සඳහන් කිරීමෙන්, ලංකා බැංකු අන්තර් ජාලය හෝ ෆෝන් බැන්කින් සේවාව භාවිතා කිරීමෙන් හෝ මුදල් ගෙවීමෙන් ඔබට ගිණුම පිරවිය හැක.

ගිණුමක් විවෘත කිරීම

### අදියර 01. අයදුම්පත

පාරිභෝගික සේවා මධ්‍යස්ථානයෙන් ලබාගත හැකි පාරිභෝගික සේවා අයදුම්පත හා පාරිභෝගික සේවා ගිවිසුම අයදුම්කරු විසින් පිරවිය යුතුයි.

### අදියර 02. පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වෙත යෑම

පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේදී, සේවා සහකරුවෙකු ඉදිරිපිටදී **"ETC"** සේවා ගිවිසුම හා **"ETC"** පාරිභෝගික සේවා අයදුම්පත ඔබ අත්සන් කල යුතුය. පාරිභෝගිකයා විසින් තම ජාතික හැඳුනුම්පත, වාහන ලියාපදිංචි පොත හා වාහනය එම අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය. ව්‍යාපාරික පාරිභෝගිකයෙකු නම් සමාගමේ තොරතුරු හා බලය පැවරීමේ ලියවිලි ඉදිරිපත් කල යුතුය.

## අදියර 03. ගිණුමක් ආරම්භ කිරීම

පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේදී එහි නියෝජිතයින් විසින් ඔබේ අයදුම්පත පරීක්ෂාවට භාජනය කරනු ලබනු අතර ආරක්ෂිත පියවරක් ලෙස එහි ඡායාරූප පිටපත් ලබා ගැනීම කෙරේ. විද්‍යුත් උපාංගය සඳහා මුදලින් ගෙවීම් කළ යුතුය.

## අදියර 04. "E-Tag" උපාංගය ලබාගැනීම හා සවිකිරීම

විද්‍යුත් උපාංගය සවිකිරීමට පෙර පාරිභෝගික සේවා නියෝජිතයෙකු විසින් ඔබගේ වාහනය හා අයදුම්පතේ සදහන් කර ඇති තොරතුරු සන්සන්දනය කරනු ඇත. අවම වශයෙන් රු.1000ක් මූලිකව ETC ගිණුමේ බැරකළ යුතුය.

## අදියර 05. "ETC" ගිණුමට මුදල් බැර කිරීම

ගාස්තු ගෙවන ස්ථානයෙන් ඔබේ වාහනය **"ETC"** මංතීරුව තුළින් ධාවනය කරවීමට පෙර ඔබ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගොස් අවශ්‍ය තරම් මුදල් ඔබේ **"ETC"** ගිණුමේ තැන්පත් කළ යුතුයි.

## ස්වයංක්‍රීය සෘජු හර පිරවීම

**"ETC"** පාරිභෝගික සේවා අයදුම්පතෙහි ඇති සෘජු හර අයදුම්පත් කොටස සම්පූර්ණ කරන්න. සෘජු හර සැලසුම් ස්ථාපිත කිරීම සඳහා ලංකා බැංකුවට පැය 24ක කාලයක් අවශ්‍ය වේ. **"ETC"** සේවාව ආරම්භ කිරීමට අපේක්ෂිත පාරිභෝගිකයින් ඕනෑම ලංකා බැංකු ශාඛාවකට නව **"ETC"** ගිණුම වෙත මූලික මුදලක් තැන්පත් කරන ලෙස නිර්දේශ කරන අතර, ඉන් පසු ගිණුම පිරවීමේ කටයුතු සෘජු හර සැකසුම මඟින් ලබාගත හැක.

## "ETC" මංතීරුව භාවිතා කරන්නේ කෙසේද?

**"ETC"** ගාස්තු එකතු කිරීමේ ප්‍රවිෂ්ඨය හරහා ධාවනය කිරීමේදී සිහි තබාගත යුතු අනිවාර්ය කරුණු 05 කි :

**(1) "ETC" මංතීරුව වෙත වාහනය යොමුකරන්න.**

**(2) වේගය පැයට කි.මී. 15 දක්වා අඩු කරන්න.**

**(3) ඔබගේ වාහනය මැනවින් නිරීක්ෂණය වන පරිදි ඔබ ඉදිරියේ ඇති වාහනයට මී. 20ක් පමණ පසුපසින් ධාවනය කරන්න.**

**(4) ඉදිරියට යාමට මාර්ග බාධකය විවෘත වී ඇද්දැයි පිරික්සන්න.**

**(5) සංඥා පුවරුවේ ඇති ඔබේ ශේෂය පරීක්ෂා කරන්න.**

### මගේ "ETC" පිරවීමට අමතක වුවහොත් කුමක් සිදුවේද?

මාර්ග බාධකය ඔබ සඳහා විවෘත නොවන අතර ඔබගේ ශේෂය "ප්‍රමාණවත් නොවන" බවට විද්‍යුත් සංඥා පුවරුවේ සටහන් වේ. එවිට ඔබ සිටිනා මං තීරුවෙන් මුදල් ගෙවන මං තීරුව වෙත ප්‍රවිශ්ට විය යුතුයි.

### මගේ වාහනයට ඉදිරියෙන් තිබෙන වාහනයට අතිශයින් සමීපවී ධාවනය කිරීමේදී සිදුවන්නේ කුමක්ද?

නියාමන සංඥා පැහැර හැරීම සම්බන්ධව පොලිස් නිළධාරීන් විසින් ඔබව දඩමුදලකට යටත් කරනු ඇත. **E -tag** උපාංගය අනාවරණය නොවන නිසා මාර්ග බාධකය විවර නොවනු ඇත.


### මම "ETC" ගිණුම් ප්‍රකාශ ලබාගන්නේ කෙසේද?

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වලින් මෙය ලබාගත හැක.

# විද්‍යුත් තාක්ෂණයෙන් ගාස්තු අයකිරීම (ETC)

### ගාස්තු අයකිරීම සඳහා ලියාපදිංචි කිරීම හා භාවිතා කිරීමේ නිර්ණායකයන්

## කටුනායක අධිවේගී මාර්ගය [E03]




සාමාන්‍ය හෝ පාරිභෝගික ගිණුම් විමර්ශනයන් සඳහා විමසීම් 1969 ඇමතීම හෝ පෑලියගොඩ, තොරණ හන්දියේ පිහිටි මාගී සංවර්ධන අධිකාරියට අයත් පාරිභෝගික සේවා මධ්‍යස්ථානය වෙත පැමිණිය යුතුයි.